ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

# **<u>පුවත්පත් නිවේදනය</u>**

## **<u>වීසා අයදුම්පත් භාර ගැනීම</u>**

වර්තමාන තත්ත්වය ද අපගේ වීසා සේවාවන් ලබා ගැනීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකික සහ වෙනත් ජාතිකයන්ගේ පහසුව ද අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයන් මුහුණ දෙන ප්‍රවාහන ගැටළු ද සැලකිල්ලට ගෙන අපගේ IVS වීසා අයදුම් මධ්‍යස්ථානය 2022 ජූලි 4 වන දින සිට සතියට දින තුනක් එනම් අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනයන් හිදී පමණක් වීසා අයදුම්පත් භාර ගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ අනුව 2022 ජූලි 4 වන සඳුදා දින අයදුම්පත් භාර නොගැනේ. මෙම දින මහ කොමසාරිස් කාර්යාලය විසින් නම් කර ඇති නිවාඩු දිනයක් වේ නම් වීසා සේවාවන් ලබා ගත නොහැකි වනු ඇත.

වීසා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයවලුන් නැවත දැනුම් දෙන තෙක් IVS මධ්‍යස්ථානයෙන් කළින් වේලාවක් වෙන් කරගෙන ඉහත සඳහන් දිනයන් හිදී පමණක් වීසා අයදුම්පත් භාර දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

වර්තමාන තත්ත්වය තුළ ඔබ සැමගේ අවබෝධය සහ සහයෝගයට ස්තූතිය පළ කර සිටිමු.

******

***කොළඹ***
***2022 ජූලි 01***